ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதான செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
Chief Secretary's Office – North Western Province
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල - மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் - Provincial Council Office Complex, Kurunegala.

මූල්‍ය කළමනාකරණ අංශය
நிதி முகாமைத்துவ பிரிவு
Financial Management Division

මගේ අංකය / எமது இலக்கம் / My No: NWP/CS/F/Bud/2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No:

දිනය / திகதி / Date: 2022.12.30

---

පළාත් භාණ්ඩාගාර (අයවැය) චක්‍රලේඛ 05/2022

වයඹ ආණ්ඩුකාරවර ලේකම්,

වයඹ පළාත් සභා ලේකම්,

වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,

වයඹ පළාතේ සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## වියදම් දැරීම සඳහා බලය දීම - 2023 මූල්‍ය වර්ෂය

2023 වර්ෂය සඳහා වූ වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කර ඇති අතර, ඊට අදාල 2022 අංක 01 දරණ විසර්ජන නියෝගය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී, සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය හා අත්තිකාරම් වොරන්ට් බලපත්‍රයද ගරු ආණ්ඩුකාරතුමන් විසින් අත්සන් කර ඇත. ඒ අනුව 2023 වර්ෂය සඳහා අනුමත කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශයේ මෘදු පිටපත www.cs.nw.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලෙස දන්වමි.

02. 2023 වර්ෂය සඳහා රජයෙන් ලබාදීමට එකඟ වී ඇති ප්‍රදානයන් , රජයෙන් ලැබෙන ආදායම් මාරු කිරීම සහ පළාත් සභාව මඟින් සෘජුවම එකතු කර ගනු ලබන ආදායම්ද උපයෝගී කරගෙන වාර්ෂික මුදල් ප්‍රකාශයේ ලැබීම් ගණනය කර ඇති අතර, එම ලැබීම් වලට යටත්ව 2023 වර්ෂයේ සියළු වියදම් දැරීමට සිදුවේ. ඒ අනුව 2023 වර්ෂයේ වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් ඔබ වැය ශීර්ෂය සඳහා අනුමත කර ඇති ප්‍රතිපාදනයන් නොඉක්මවා වියදම් දැරීම සඳහා මෙයින් බලය දෙමි.

03. 2023 වර්ෂයේ නව බැරකම්වලට බැඳීමට පෙර පළමුකොට 2022 වර්ෂයෙන් 2023 වර්ෂයට රැගෙන යාමට අනුමත බැරකම් වේනම්, ඒවා බේරුම් කිරීමට හෝ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කොට තැබීමට කටයුතු කළ යුතු වේ. ඉන්පසු ඉතිරිවන ප්‍රතිපාදන ඇතුළත කටයුතු කරගෙන යාමට මැනවින් සැළසුම් කර ගත යුතුවේ. වියදම් හා බැඳීම් දැඩි ලෙස විමර්ශනයට භාජනය කළයුතු වන අතර, ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම වළක්වා ගැනීම සඳහා අවශ්‍ය සියළු පියවරයන් ඔබ විසින් ගතයුතු වේ.



ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary — Tel: 037-2228019, Fax: 037-2223777, e-mail: chiefsecretary@nw.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதான செயலாளர் அலுவலகம் / Chief Secretary's Office — Tel: 037-2231769-72, Fax: 037-2222234, e-mail: csnwp@sltnet.lk, Web site: www.cs.nw.gov.lk
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) / பிரதி பிரதான செயலாளர் (நிதி முகாமைத்துவம்) / Deputy Chief Secretary (Financial Managment) — Tel: 037-2223731, Fax: 037-2228128, e-mail: dcsfnnwpc@yahoo.com, dcsfinance@nw.gov.lk